**e - ඥාන පියස වැඩසටහන**
**දියමන්ති ව්‍යාපෘතිය**
**සමාන්‍ය පාඩම් - 1 පාඩම**

| විෂය | ශ්‍රේණිය | වාරය | පාඩම/ඒකකය |
|---|---|---|---|
| චිත්‍ර කලාව | 10 | III | 1.1.5. මානව හා සත්ත්ව රූප ඇතුළත් පරිසරය පුළුල්ව අධ්‍යයනය කර චිත්‍ර සංරචනය කරයි. |

**ජනාකීර්ණ වීදියක්**

- දී ඇති පින්තූර හොඳින් නිරීක්ෂණය කරන්න.
- එහි දැකිය හැකි මානව ඉරියව් වල ඇති ක්‍රියාශීලී බව හා කාර්යබහුල බව අවබෝධයෙන් ක්‍රියාකාරකමෙහි නිරතවන්න.
- ඔබගේ පරිකල්පන ශක්තිය වඩාත් දියුණු කර ගැනීමට ඔබම මනසේ මවාගත් රූ සිතුවමට නැගීමට උත්සාහ ගන්න.
- වර්ණ කිරීම සඳහා සුදුසු වර්ණ මාධ්‍යයක් තෝරා ගන්න
- පහත උපදෙස් අනුගමනය කරන්න
    - ✓ පර්යාවලෝකය - ළඟ ඇති වස්තූන් විශාලවත් දුර ඇති වස්තූන් ඈතට යන විට කුඩාවටත් පෙනීම.
    - ✓ වර්ණ පර්යාවලෝකය - ළඟ වර්ණ වඩාත් හොඳින් යොදා ඈත වර්ණ ලා පැහැයෙන් යෙදීම.
    - ✓ එළිය අඳුර - චිත්‍රයේ ත්‍රිමාණ ලක්ෂණ මතුකර දක්වන ප්‍රධාන ශිල්ප ක්‍රමයයි.




**<u>ඇගයීම</u>**

- දී ඇති සිතුවම් හොඳින් අධ්‍යයනය කරන්න
- වීදියේ ගමන් කරන එක් එක් පුද්ගලයන්ගේ විවිධ ඉරියව්වල දළ සටහන් නිර්මාණය කරන්න
- එම දළ සටහන් සම්පිණ්ඩනය කර චිත්‍රය නිර්මාණය කරන්න
- තේමාවට අදාළ පරිසරය හා පසුබිම සකස් කරන්න
- උචිත වර්ණ මාධ්‍යයක් තෝරා ගන්න
- එළය හා අඳුර යොදා ත්‍රිමාණ ලක්ෂණ භාවිත කරමින් වර්ණ සමබරතාවය රැකෙන පරිදි වර්ණ කිරීමේ යෙදෙන්න